# සාරාංශය: සමෘද්ධිය කරා සියලු ශ්‍රී ලාංකිකයන් ළඟා කරවීම

රටවල පවතින ආර්ථික පරිසරයෙහි අසමතුලිතභාවය දිනෙන් දින වර්ධනය වන තැන්හී ආර්ථික ප්‍රගතිය, මූලික අවකාශීය විතැන්වීමක් සමඟ සිදුවේ. පහළ ආදායම් තත්වයන් හී සිට ඉහළ ආදායම් තත්වයන් දක්වා වූ ගමන් මඟෙහි ස්ථාන කිහිපයක පමණක් සමෘද්ධිමත්භාවය සංකේන්ද්‍රණය වීම දැකගත හැකි වේ. අසමතුලිත ආර්ථික වර්ධනය සාමාන්‍ය ක්‍රමය වන අතර, එය ලොව වඩාත්ම සමෘද්ධිමත් රටවල් අතර වන එක්සත් ජනපදය සහ ජපානය වැනි රටවල් සිය ආර්ථික වර්ධනය කරා යෑමේදී පෙන්නුම් කළ ලක්ෂණයක් විය. චීනය, ඉන්දියාව සහ සමෘද්ධිය කරා ළඟාවෙමින් සිටින ලෝකයේ අනෙකුත් රටවල් වලද අසමතුලිත ආර්ථික වර්ධනය නැවත නැවත සිදුවෙමින් පවතී. ඒ සමඟම, ආර්ථිකමය අවස්ථාවනට දුරස්ථව තම ජීවිකාව ආරම්භ කරන්නන්ට, ස්ථාන කිහිපයකට ධනය සංකේන්ද්‍රණය වීම ඉහළ යාමෙන් වාසි අත්කරගත හැකි බැවින් සංවර්ධනය තවදුරටත් අන්තර්ගත විය හැක. 'සමෘද්ධිය කරා ජනතාව ළඟා කරවීම' යන්න අසමතුලිත ආර්ථික වර්ධනය සහ අන්තර්ගත සංවර්ධනය යන දෙඅංශයෙහිම වාසි අත්කර ගැනීම සඳහා උපකාරී වන්නාවූ ආර්ථික ඒකාබද්ධතා ප්‍රතිපත්ති පසුපස ඇති මූලධර්මයයි. මේවා ''ආර්ථික පරිසරය ප්‍රතිසැකැසීම'' (ලෝක බැංකුව, 2008) යන මැයෙන් වූ ලෝක සංවර්ධන වාර්තාව 2009 මඟින් පිළිබිඹු වූ ප්‍රධාන කරුණු වේ.

දිගුකාලීන සංවර්ධනයක් සඳහා මුල පුරා ඇති ශ්‍රී ලංකාව සඳහා මෙම ප්‍රතිපත්ති වැදගත් වේ. ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් උපයන තත්වයට ළඟා වීම, ගෝලීය වෙළෙඳපොල ශ්‍රී ලංකාව කෙරෙහි දක්වන ආකල්පයෙහි වේගවත් වෙනසක් සමඟින් සිදුවිය. 1975 සහ 2005 අතර කාලයේදී, නිෂ්පාදකයෝ ජාතික අපනයන ප්‍රමාණයන් සියයට 6 සිට සියයට 60 දක්වා ප්‍රමාණයකින් වේගයෙන් ඉහළ දැමූහ. මෙය රටෙහි ආර්ථික පරිසරය ප්‍රතිසැකැසීමට හේතු විය. වර්තමානයේදී ලෝකයේ අනෙකුත් රටවල් සමඟ ශ්‍රී ලංකාව සම්බන්ධතාවය ගොඩනඟා ගෙන ඉදිරියට පියමනිනුයේ කෘෂිකර්මාන්තය තුළින් නොව වෙළෙඳ ව්‍යාපාර මඟිනි. තවද මෙම වෙළෙඳ ව්‍යාපාර, 2008 දී මිලියන 3.7 ක[1] බහාලුම් මෙහෙයවූ වරායක් සහිත කොළඹ නගරයට ආසන්නයේ සිදුවන නිෂ්පාදන සංකේන්ද්‍රණය තුළින් වාසි අත්කර ගනී. එහි ප්‍රතිඵලයක් ලෙස, කොළඹ නගරය සහ ඒ අවට ප්‍රදේශ සමෘද්ධිමත් භාවයට පත්ව ඇත. වර්තමානයේදී බස්නාහිර පළාත තුළ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 50 කට වඩා ප්‍රමාණයක් නිපදවීම සිදුවන අතර 540,000 ක ජනතාවකට රැකියා සපයන කාර්මික නිෂ්පාදන ඒකක 37,000 ක් පිහිටා තිබෙන අතර ආකලිත වටිනාකමින් රුපියල් බිලියන 527 ක්[2] උපයයි.

**1 රූපසටහන කොළඹ අවට ඇති ආකර්ෂණීය ආර්ථික කඳු දුර සිට බැලූ විට කුඩා කඳු ගැටයක් මෙන් පෙනේ**






සටහන: උප දළ ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු වලට පදනම්ව ලෝක බැංකු සංවර්ධන පර්යේෂණ කණ්ඩායමෙහි අවකාශීය විශ්ලේෂක කණ්ඩායම

නිෂ්පාදනය සංකේන්ද්‍රණය වීම අතින් අනෙකුත් පළාත් වලට වඩා බස්නාහිර පළාතෙහි ඵලදායීතාවය සහ වැටුප් දෙගුණයක් වේ. කොළඹ අවට ආර්ථික කඳු වල වර්ධනය ආකර්ෂණීය වූ අතරතුරදී, කොළඹ නගරය වර්ධනය කරා තවදුරටත් ගමන් කළ යුතු වේ (1 වන රූපසටහන). කොළඹ නගරයේ ආර්ථික ඝනත්වය වර්ග කිලෝමීටරයකට ඩොලර් මිලියන 15 ක් වේ. මෙම තත්වය ලෝක වෙළඳපොළ සමඟ තම රටවල් සම්බන්ධ කරන ස්ථාන වන හෝ චී මින් නගරයේ වර්ග කිලෝමීටරයට ඩොලර් මිලියන 73, බැංකොක් හි වර්ග කිලෝමීටරයට ඩොලර් මිලියන 88 සහ සිංගප්පූරුවෙහි වර්ග කිලෝමීටරයට ඩොලර් මිලියන 269 ලෙස වන ආර්ථික ඝනත්වය හා සසඳා බැලිය හැක.

කොළඹ නගරයට දුරස්ථව තම ජීවිත ආරම්භ කළ අය ද ඇතුලුව බොහෝ ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වයන් වැඩිදියුණු කිරීමට බස්නාහිර පළාතෙහි සමෘද්ධිමත්භාවය හේතු වී ඇත. කොළඹ ජීවත්වන්නන්ගෙන් 650,000 කට වැඩි පිරිසක් ඉපදී ඇත්තේ රටෙහි අනෙකුත් ප්‍රදේශවලය. බොහෝ දෙනෙක් ගාල්ල, කළුතර සහ මහනුවර යන ප්‍රදේශවලින් මෙන්ම දුරබැහැර යාපනය වැනි ප්‍රදේශ වලින් ද කොළඹට සංක්‍රමණය වී තිබේ. A1 සහ A2 වැනි ජාතික මට්ටමේ මහා මාර්ග පද්ධතිය හේතුවෙන් ප්‍රවාහන පිරිවැය අවම කොට පළාත් හරහා නිෂ්පාදනය ගලායෑම පහසු වී ඇති බැවින් අන් ජනතාවද කොළඹ නගරය හා භෞතික වශයෙන් සම්බන්ධ වී ඇත.

ආර්ථික නිෂ්පාදනය සංකේන්ද්‍රණය වී ඇති අතරතුරදී, සමාජ සුභසාධනය මට්ටම් කිරීමේදී රාජ්‍ය ප්‍රතිපත්ති සාර්ථකත්වයට පත්ව තිබේ. දුගී භාවය සියලු පළාත් හි අවම වී ඇති අතර අධ්‍යාපනය, මූලික සෞඛ්‍ය සේවා මෙන්ම ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් ද රටපුරා ව්‍යාප්ත කරනු ලැබේ. මෙම තත්වය ලෝකය සහ කලාපය තුළ ශ්‍රී ලංකාව ආර්ථික සමෘද්ධියෙහි ඊළඟ පියවරෙහි වාසි ලබාගැනීමට සහ ශ්‍රී ලංකාව සමෘද්ධිය කරා යන ගමන මධ්‍ය ආදායම් හරහා වේගවත් කිරීම සඳහා සූදානම් කොට තිබේ. කෙසේ වෙතත්, මෙම අවස්ථාවන්ගෙන් ඵල නෙලා ගැනීමේදී තම ප්‍රතිත්ති මඟින්

අවකාශීය පරිවර්තනයන් සිදුවීමේ වේගය ක්‍රමයෙන් වැඩි කිරීමට සහ වැඩි ශ්‍රී ලාංකිකයන් පිරිසක් මෙම අවස්ථාවන් සමඟ සම්බන්ධ කිරීම අවශ්‍ය කෙරේ. ප්‍රාදේශීය වශයෙන් විශේෂිත වූ අභියෝගයනට මෑතදී සකස් කොට සම්පූර්ණ කරන ලද ගැටලු නිශ්චය කිරීම් සහ විසඳුම් විකල්පයන් කෙරෙහි අවධානය යොමු කරමින් ''ශ්‍රී ලංකාව : සමෘද්ධිය කරා ජනතාව සම්බන්ධ කරවීම'' යන මැයෙන් වූ මෙම වාර්තාව ඉහත ප්‍රතිපත්ති සහ ඒ ආශ්‍රිත ආයෝජන ප්‍රමුඛතාගතකරණය කිරීම සඳහා පෙර දැක්මක් සපයයි.

## සමෘද්ධිය කරා ජනතාව සම්බන්ධ කරවීම

වෙළඳ ව්‍යාපාර සහ සේවකයන් විසින් අතහැර දමන ලද ප්‍රදේශයන්හි ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමට උත්තේජ සැපයීම කෙරෙහි උනන්දු වීමට වඩා ආර්ථික වර්ධනය අතින් පසුගාමී සහ ප්‍රතිගාමී ප්‍රදේශ අතර සම්බන්ධතා වැඩිකර ගැනීම කෙරෙහි රාජ්‍ය ප්‍රතිපත්තිය විසින් අවධානය යොමු කළ යුතු බව හුවා දක්වමින් 'ආර්ථික පරිසරය ප්‍රතිසැකසීම' යන මැයෙන් වූ 2009 ලෝක සංවර්ධන වාර්තාව පළාත්බද ඒකාබද්ධතාවය සඳහා ප්‍රතිපත්ති රාමුවක් සපයයි.

'ආර්ථික පරිසරය ප්‍රතිසැකසීම' යන මෙම වාර්තාව වේගවත් ආර්ථික ප්‍රගතිය සහ විවිධ ස්ථාන ඔස්සේ ජීවන තත්වයන් ඉහළ නැංවීමට අවශ්‍ය සාධක ඒකරාශී වීම යන මෙම හේතුවෙන් ඇතිවන තත්වයන්ගෙන් ඇතිවන ඵල නෙලා ගැනීමට අවශ්‍ය කරනු ලබන ප්‍රධාන මූලද්‍රව්‍ය ලෙස භූගෝලීය වශයෙන් ශ්‍රම සංචලතාවට ඉඩකඩ සැලසීම සහ පසුගාමී සහ ප්‍රතිගාමී සංවර්ධනයක් ඇති ප්‍රදේශ අතර ආර්ථිකමය වශයෙන් ඇති සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම අවධාරණය කරනු ලැබේ. මේ සඳහා කුමන ප්‍රතිපත්ති ආධාර විය හැකිද?

සැලසුම්කරණය අතින් ''අවකාශමය වශයෙන් අඳ'' ප්‍රතිපත්ති අවකාශමය වශයෙන් තියුණුම ප්‍රතිඵල ගෙන දිය හැක. මෙම සාමාන්‍ය ව්‍යවහාරයන්ට අනුක්‍රම අයබදු ප්‍රතිපත්ති, මූලික සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවා දර්ශකයන්හි ජාතික මට්ටමින් අවශ්‍ය කරන අවම තත්වයන් ළඟා කර ගැනීම සහ ශ්‍රම සංචලතාවයට ඇති බාධක මඟ හැරීම ඇතුළත් වේ. ඊට අමතරව ප්‍රවාහන සහ සන්නිවේදන වැඩිදියුණු වීම් වැනි ''අවකාශමය වශයෙන් සම්බන්ධක'' ප්‍රතිපත්ති සංවර්ධනය පසුගාමී සහ ප්‍රතිගාමී ප්‍රදේශ එකිනෙක සම්බන්ධ කරයි. අභ්‍යන්තර විභජන හේතුවෙන් සාධක සංචලතාව දුර්වල වන විටදී පමණක් භාවිතා කිරීම සඳහා ආර්ථික සංවර්ධනය සඳහා උත්තේජ සැපයීමට ''අවකාශමය ලෙස ඉලක්කගත'' මැදිහත්වීම් අවසාන තුරුම්පුව ලෙස භාවිතා කළ හැකි ප්‍රතිපත්තිමය ක්‍රමවේදයන් විය යුතු ය (2 වන රූපසටහන). මෙම අවස්ථාවලදී, මැදිහත්වීම් සැලකීමට භාජනය වීමට ඉඩ ඇත්තේ සංසන්දනාත්මක වාසි අත්වන මූලාශ්‍රයන් හඳුනාගැනීමට අවශ්‍ය කරන තොරතුරු පිළිබඳ සොයා බැලීමෙන් අනතුරුව සහ අවකාශමය ලෙස අඳ සහ සම්බන්ධක ප්‍රතිපත්ති වලින් අත්වන වාසි පුළුල් කිරීමට පමණි. කෙසේ වෙතත්, මේවායේ වර්තමාන ස්වරූපය අනුව, ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රතිපත්තීන් හී අධික ලෙස අවධානයට යොමුකළ අවකාශමය ලෙස ඉලක්කගත කිරීමේ ස්වරූපයක් දැකගත හැකිවේ. දුගී බව වැඩිම ප්‍රදේශයන්හි ආර්ථිකය වර්ධනය කිරීමට ජවයෙන් යුතු ආරම්භයක් ලබාදිය හැකි වන්නේ කුමන ප්‍රතිපත්ති වලට ද?

එහෙත් අවසනාවන්ත ලෙස මෙම ප්‍රයත්නයන් අපේක්ෂිත ආර්ථික ලාභාංශ උත්පාදනය කිරීමට අසමත් වී ඇත. කොළඹින් බැහැරව ආර්ථික කටයුතු සිදුකිරීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් ලබාදෙනු ලබන පරිත්‍යාගශීලී දිරිදීමනා පිළිබඳව අවධානය මදකට යොමු කිරීම වැදගත් වේ. මෙම වාර්තාවෙහි විශ්ලේෂණය මඟින් පෙන්වා දෙනු ලබන පරිදි, ආයෝජන මණ්ඩල නීතියෙහි 17 වන පරිච්ඡේදය යටතේ

**2 රූපසටහන: පළාත්බද සංවර්ධන ප්‍රතිපත්ති වර්ගීකරණය**




මූලාශ්‍රය: ලෝ.ස.වා. 2009

අනුමැතිය ලත් ආයෝජන වලින් සියයට 80 ක් වැය කර ඇත්තේ සහ ඇඟලුම් කර්මාන්ත 200 වැඩසටහන දියත් වූයේ සංවර්ධනය පසුගාමී ප්‍රදේශ වල නොව බස්නාහිර පළාත තුළය. තවද, සංවර්ධනය පසුගාමී ප්‍රදේශයන්හි ග්‍රාමීය රැකියා උත්පාදනය සඳහා උපකාර කරන නියමු ව්‍යාපෘතියක් වන ''නිපැයුම් ශ්‍රී ලංකා'' යටතේ වෙන් කෙරුණු රුපියල් බිලියන 44 ක ආයෝජන වලින් රුපියල් බිලියන 21 ක්ම භාවිතා කරනු ලබන්නේ බස්නාහිර පළාත ආසන්නයේම වන වයඹ පළාත සඳහාය. අනෙකුත් ව්‍යාපාර වලට සහ ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවිශ්ට වීමේ මාර්ගයන්ට ආසන්නයේ තිබීමෙන් වෙළඳ ව්‍යාපාර වාසි ලබන බැවින් කාර්මික ප්‍රතිස්ථානගත කිරීමේ ප්‍රතිපත්ති, ඵලදායීත්වයට සහ ලාභදායී භාවයට හානි පමුණුවනු ඇත. එසේම, කෘෂිකාර්මික භූමි භාවිතය සහ පැවරීම පිළිබඳ රෙගුලාසි තුළින් සංවර්ධනය පසුගාමී ප්‍රදේශයන්හි ග්‍රාමීය සංවර්ධනය උත්තේජනය කිරීමට දැරූ ප්‍රයත්න පුනර්ඵලදායී විය (Counter Productive). භූමි සංවර්ධන අණ පනත් ග්‍රාමීය ප්‍රදේශයන් හි නානාංගකරණය සීමා කර ඇතිවා පමණක් නොව, ගොවිපළ සහ ගොවිපළවලින් බැහැර කටයුතු යන දෙඅංශයෙහිම වැටුප් පිරිවැය සාපේක්ෂ ලෙස අඩු බැවින් මෙම අණ පනත් දුගී භාවය අවම කරලීමේ වේගය ද අඩු කර ඇත. පළාත්බද ඒකාබද්ධතාවය සඳහා හේතුවන වඩා තියුණු ක්‍රමවේදයන් කවරේද?

පළමුව, සෑමතැන්හිම මූලික සේවා ලබාගත හැකි බව තහවුරු කළ යුතු වේ. මධ්‍ය ආදායම් උපයන ශ්‍රී ලංකාවට මූලික සේවා යන්නට කුමක් ඇතුළත් කළ යුතුද යන්න නිර්ණය කිරීමේදී අපේක්ෂාසහගත විය හැක. වර්තමානයේ මුහුණ දෙනු ලබන අභියෝගය භූගෝලීය වශයෙන් සාධාරණීය ලෙස සම්පත් ළඟා කරගැනීම පිළිබඳ වූවක් නොව සේවාවන්හි ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම පිළිබඳ වූවකි. 8 වන ශ්‍රේණියේ අධ්‍යාපනය හදාරන සිසුන්ගෙන් සියයට 70 ක් පමණක් තම මව්භාෂාව සහ ගණිතය විෂයය සමත්වන අතර සියයට 50 ක් පමණක් ඉංග්‍රීසි භාෂා විෂයය සමත්වන අධ්‍යාපන ක්‍රමයක අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය තවදුරටත් වර්ධනය කිරීම අවශ්‍ය කෙරේ. තවද උතුරු සහ නැගෙනහිර පළාත්වල ශිෂ්‍යයන්ගේ කාර්යසාධනය ඉතා දුර්වල වේ. සංවර්ධනය පසුගාමී ප්‍රදේශයන්හි ළමුනට සංවර්ධනය

වේගවත් ප්‍රදේශයන්හි ශ්‍රම වෙළඳපොල වෙතට ප්‍රවිෂ්ට වීමේ හැකියාව ලබා දෙනු ඇති බැවින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ අදාළත්වය ඉහළ නැංවීම ඉහළ ප්‍රමුඛතාවයකින් සැලකිය යුතු වේ.

මෙම වාර්තාවට අදාළ පර්යේෂණ පෙන්වා දෙන පරිදි බස්නාහිර පළාතෙහි අධ්‍යාපනය සඳහා දරන පිරිවැය අන් පළාත්වලට වඩා ඉහළ අගයක් ගන්නා අතර, අන් පළාත්වලින් සිදුවන ශ්‍රම සංචලතාවයට ඉඩකඩ සැලසීම ජාතික දරිද්‍රතාවය තවදුරටත් අවම කරලීම සඳහා දායකත්වයක් දක්වනු ඇත. අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ එක් මාර්ගයක් නම් පාසැල් අධ්‍යාපනයට යොමුවීමේ ප්‍රමාණය අවම ප්‍රදේශ ඒකාබද්ධ කිරීම සහ අත්‍යාවශ්‍ය ඉගෙනුම් - ඉගැන්වීම් උපකරණ සඳහා දරන වියදම අවම කිරීමේ ක්‍රම භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමයි. නමුත් ජාත්‍යන්තර මට්ටම් හා සසඳ බලන කළ ශ්‍රී ලංකාව අධ්‍යාපනය සඳහා අයෝජනය කරන්නේ අඩු මුදලක් වන අතර, කාලයත් සමඟ අධ්‍යාපනය සඳහා දරන රාජ්‍ය ආයෝජන ද ඉහළ දැමීම අවශ්‍ය වේ. ජාතික මට්ටමේ වෙනසක් සඳහා තෘතීය අධ්‍යාපනය ඉතා වැදගත් සාධකයක් වනවාට කිසිදු සැකයක් නොමැති අතර, මෙහි දැක්වෙන විශ්ලේෂණයට අනුව, උසස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ විෂමානුපාතිකව භුක්ති විඳිනු ලබන්නේ බස්නාහිර පළාතෙහි පොහොසත් පවුල් විසිනි. අවකාශමය කාර්යක්ෂමතාව සහ සමෘද්ධිය කරා ජනතාව සම්බන්ධ කරවීමේදී විකල්පයන් අතර තෘතීය අධ්‍යාපනය ලබාදීමේ දී පෞද්ගලික අංශයේ මැදිහත්වීම ද ඇතුළත් විය යුතු වේ.

මීළඟට සෞඛ්‍ය සේවාවන්හි තත්වය දෙස අවධානය යොමු කරන්න. සෞඛ්‍ය සේවා ආවරණය දෙස බැලූ කල එය පළාත් හරහා ඉතා අල්ප වශයෙන් සමාන ව්‍යාප්තියක් පෙන්නුම් කරන අතර මධ්‍ය ආදායම් ලබන රටවල් වල තත්වය සමඟ සැසඳීමේදී රෝහල් ඇඳන් හි අතිරික්තයක් දක්නට ලැබේ. නමුත් පළාත් සභා මඟින් පාලනය වනු ලබන රෝහල් ජාලයෙහි සේවා අවභාවිතා වනු ලබන අතර, ජනතාව මෙම පහළ මට්ටමේ පහසුකම් ඉක්මවා යමින් වඩා හොඳ පහසුකම් සහිත මෙන්ම පුළුල් සේවාවක් සපයන මධ්‍යම ආණ්ඩුව මඟින් පාලනය කරනු ලබන රෝහල් කරා ඇදී යති. විධිමත් විශේෂඥ සේවා පද්ධතියක්

**3 රූපසටහන: ක්‍රමෝපායික ප්‍රවාහන වර්ධනයන්ට "දුගී ජන සමූහයා" ව "සමෘද්ධියෙහි හිණිපෙත්" කරා සම්බන්ධ කළ හැක**




මූලාශ්‍රය: ආර්. ගෙල්නර් සහ පිරිස (පසුබිම් පත්‍රය)
HIES දත්ත, 2006
උප ජාතික දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු මත පදනම්ව ලෝක බැංකු DECRG

නොලැබෙන සහ සමස්ත සෞඛ්‍ය පද්ධතිය තුළම නොමිලේ සපයන සේවා තිබීම මේ තත්වයට හේතු වූවා විය හැක. දුෂ්කර ප්‍රදේශයන් හි ඇති අඩු පහසුකම් හේතුවෙන් ද විශේෂඥ වෛද්‍යවරු, වෛද්‍ය නිලධාරීන් සහ හෙදියන්ගේ සේවය එම ප්‍රදේශ වලට ලබාගැනීමේ අපහසුතා ඇතිවනුයේ පළාත් සභා මඟින් පාලනය වන රෝහල්හි ඇති පහසුකම් බොහෝවිට අඩු වීමය. තවදුරටත් සෞඛ්‍ය බලධාරීන්ට වඩා හොඳ පහසුකම් සහිත රෝහල් පැවතීම සහ උදාහරණයක් ලෙස පෞද්ගලිකව ආදායම් ඉපයිය හැකි අවස්ථා වැඩි වශයෙන් තිබීම වැනි අනෙකුත් සෞඛ්‍ය නොවන පහසුකම් හේතුවෙන් සුදුසුකම් ලත් පුද්ගලයන් බස්නාහිර පළාතට ඒකරාශී වීම තවදුරටත් සිදුවෙමින් පවතී.

දෙවනුව, සංවර්ධනය පසුගාමී සහ දියුණු ප්‍රදේශ එකිනෙක සම්බන්ධ කිරීමට යටිතල පහසුකම් දියුණු කිරීම. ජාත්‍යන්තර තත්වයන්ට අනුව බලන කල ශ්‍රී ලංකාවෙහි ප්‍රවාහන වියදම අධික වේ. නිෂ්පාදන එහා මෙහා ගෙන යාමට කිලෝමීටරයකට ඩොලර් 2.90 ක මුදලක් මෙහිදී වැයවන විට ඒ සඳහා එක්සත් ජනපදයෙහි දී වැයවන්නේ එම මුදලින් අඩකටත් වඩා අඩුවෙන්, එනම් ඩොලර් 1.25 ක මුදලකි[3]. ගොඩැලි සහිත මාර්ග ප්‍රවාහන වියදම වැඩි කරන අතර, මෙම පිරිවැය ප්‍රවාහන සේවා සඳහා ඉහළ ඉල්ලුමක් ඇති ගමන් මාර්ග සඳහා දැඩි ලෙස අනර්ථකාරී වේ. ජාතික මට්ටමේ කාර්යක්ෂමතා කෝණයකින් බලන කල්හි, පවත්නා අභියෝගය වනුයේ ප්‍රවාහන පිරිවැයෙහි ඉහළම සමස්ත පහළ වැටීම් ඇති කරන ප්‍රවාහන අංශයේ වර්ධනයන් හඳුනා ගැනීමයි. අවකාශමය ලෙස සාධාරණ කෝණයකින් බලන කල්හි, පවත්නා අභියෝගය වනුයේ දුෂ්කර ප්‍රදේශ අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමයි. ප්‍රවාහන ප්‍රතිපත්ති හට මෙම කාර්යක්ෂමතා-සාරණීය සමථයන් කළමණාකරණය කළ හැක්කේ කෙසේද ?

වාහන ගමනාගමනයේ ප්‍රමාණය අතින් බැලූ කළ, දිනකට වාහන 60,000 ත් 80,000 ත් අතර ඉහළ අගයක් ගන්නා කොළඹ නගර සීමාවට ආසන්නයේදී A1, A2, A3 සහ A4 යන ජාතික මට්ටමේ මහා මාර්ග හරහා ගොඩැලි සහිත මාර්ගයන්හි ගමනාගමනය සඳහා වන සමස්ත පිරිවැය වඩාත් දැනේ. ඊට ප්‍රතිවිරුද්ධව ඌව පළාතෙහි ජාතික තලයේ මහාමාර්ගයන්හි සාමාන්‍ය වාහන ගමනාගමනය දිනකට වාහන 1,500 ත් 2,500 ත් අතර වේ. සංවර්ධනය කරා යොමුවන බවක් දිස්වන ප්‍රදේශයන්හි ගමනාගමනය සඳහා අවශ්‍ය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සමස්ත ප්‍රවාහන පද්ධතියෙහිම කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සහ දිවයින පුරා ප්‍රවාහන පිරිවැය අවම කිරීමට හේතු වන බව පෙනීමට තිබේ. කොළඹ සහ නුවර (මෙන්ම මධ්‍යම පළාත) සම්බන්ධ කරන මාර්ගය වැඩිම වාහන ප්‍රමාණයක් එහා මෙහා ගමන් කරන මාර්ගය වනවා සේම එය ඉතා විශාල දුගී ජනතාවක් ආර්ථික සමෘද්ධිය කරා සම්බන්ධ කරවයි. මාර්ගයන්හි යටිතල පහසුකම් ගමනාගමන ඉල්ලුම සහ ප්‍රවාහන පිරිවැය පිළිබඳව අවකාශමය වශයෙන් විස්තරාත්මක දත්ත ඇතුළත් අනුකරණයන් මඟින් ද නුවර සහ කොළඹ අතර ප්‍රවාහන අංශයේ සංවර්ධනයන්ට ජාතික මට්ටමෙන් මෙන්ම ඌව, නැගෙනහිර සහ උතුරු පළාත්වල සංවර්ධනය පසුගාමී ප්‍රදේශවලටද විශාල ලෙස පිරිවැය අවම කිරීමේ මාර්ග නිර්මාණය කළ හැක. කොළඹ-නුවර අධිවේගී මාර්ගය සහ දක්ෂිණ අධිවේගී මාර්ගයෙහි වැඩිදියුණු කිරීම් ඉහළ ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරනුයේ මෙම ප්‍රවාහන මහාමාර්ගයන් එලදායී අයුරින් ''දරිද්‍රතා කළු'' ''සමෘද්ධියේ උච්චස්ථානයන්'' වෙත සම්බන්ධ කරන විශාල වෙළඳපොළවල් හේතුවෙනි (3 වන රූපසටහන). ප්‍රවාහන අංශයෙහි සංවර්ධනයන් සඳහා රජයේ ආයෝජන වලදී මෙම ආයෝජනයන් සඳහා ප්‍රමුඛතාවයක් දිය යුතු වේ. ''මෙය හුදෙකලා ප්‍රදේශයන් හි භෞතික වශයෙන් ඇසි සම්බන්ධතාවය පිළිබඳව කුමක් පෙන්නුම් කරන්නේද?''

ජාලමය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට අමතරව, පාසැල්, සෞඛ්‍ය පහසුකම් සහ ප්‍රාදේශීය වෙළඳපොළ වැනි මූලික සේවා ළඟා කර ගැනීම සඳහා ප්‍රවාහන අංශයේ සංවර්ධනයන් අවශ්‍ය කරනු ඇත. මිනිසුන් හට සුභසාධනය වැඩිදියුණු කිරීමට සහ ප්‍රාදේශීය වශයෙන් ඇති අවස්ථාවන්ගෙන්

උපරිම ප්‍රයෝජන ලබාගැනීමට මෙම සේවා වෙත ළඟාවීම වැදගත් වන අතරතුරදී, හුදෙකලා ප්‍රදේශවල සාම්ප්‍රදායික ප්‍රවාහන සේවා ලබාදීමට, නඩත්තු කිරීමට සහ ඒ සඳහා ආධාර කිරීමට වැඩි පිරිවැයක් දැරීමට සිදුවේ. පවතින අඩු ඉල්ලුම හේතුවෙන් ඉහළ ස්ථාවර පිරිවැය සහිත සේවා සපයන විධිමත් ප්‍රවාහන සේවා සපයන්නන් මෙම සේවා සැපයීම සඳහා ඉදිරිපත් වීම අධෛර්යමත් වීම කිරීම හේතුවෙන් මෙහෙයුම් අභියෝගය වනුයේ ප්‍රාදේශීය පදිංචිකරුවන් විසින් මෙහෙයවා පවත්වාගෙන යා හැකි අතරමැදි

**4 රූපසටහන: සාමයෙහි ඵල නෙලා ගැනීම : තෝරාගත් වෙළඳ ද්‍රව්‍ය කිහිපයක් සම්බන්ධයෙන් යාපනය සහ කොළඹ අතර මිල ගණන් ඒකරාශී වීම**




මූලාශ්‍රය: මිල දර්ශකය, පොයින්ට් පෙඩ්රෝ ආයතනය, 2009 සැප්තැම්බර්

ප්‍රවාහන ක්‍රම (IMT) සඳහා දිරිමත් කිරීමය. ග්‍රාමීය ප්‍රදේශයන්හි සංචලතාවය ඉහළ නැංවීම සඳහා පාපැදි, අත් කරත්ත, යතුරු පැදි සහ ට්‍රේලර්, ගොන් කරත්ත සහ ට්‍රැක්ටර් වැනි වාහන භාවිතා කිරීම සාමාන්‍ය ලක්ෂණයකි. ග්‍රාමීය සංචලතාව වැඩිදියුණු කළ හැකි මෙම සේවා සැපයීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රජාවෙහි දායකත්වය දිරිමත් කිරීම ඉතා ඵලදායී විකල්පයකි.

අවසන් වශයෙන් සංවර්ධනය පසුගාමී ප්‍රදේශයන්හි ඉලක්කගත මැදිහත්වීම් : වසර ගණනාවක් පුරා පැවැති ගැටුම්කාරී තත්වය සහ අභ්‍යන්තර වශයෙන් වූ බෙදීම් හේතුවෙන් උතුරු සහ නැගෙනහිර වැනි සංවර්ධනය පසුගාමී සමහර ප්‍රදේශයන්හි සංක්‍රමණය සහ අන්තර්කලාපීය වෙළඳාම අඩාල වී තිබිණි. සාමයෙහි ප්‍රතිලාභ අතරට මේ වන විටත් නිෂ්පාදන වේගවත් ලෙස එහා මෙහා ගෙන යෑම සහ මිල ගණන් ඒකරාශී වීම ඇතුළත් වී ඇත. එල්.ටී.ටී.ඊ. ය හමුදා බලය අත්පත් කර ගැනීමෙන් පසු 1990 දී ආර්ථික සම්බාධක පනවන ලද උතුරු පළාතෙහි යාපනය අර්ධද්වීපයෙහි තත්වය දෙස සලකා බලන්න. 1995 දී නැවත රජය යාපන අර්ධද්වීපයෙහි බලය අත්පත් කර ගත්තද භාණ්ඩ ප්‍රවාහනය සිදුකළ හැකි වූයේ සාමාන්‍යයෙන් ත්‍රිකුණාමලයෙහි සිට නැව් මඟින් පමණි. 2002 සටන් විරාමයෙන් පසුව A9 මාර්ගය නැවත විවෘත කිරීමෙන් පසු යාපනය සහ රටෙහි අනෙකුත් ප්‍රදේශ අතර මාර්ග සම්බන්ධතාවය තාවකාලිකව ප්‍රතිස්ථාපනය වූ අතරතුර, එල්ටීටීඊ ය විසින් පැනවූ නීතියට පටහැනි බදු හේතුවෙන් භාණ්ඩ එහා මෙහා ප්‍රවාහනය අඩාල වුණි. එසේම නැවත ගැටුම් ඇතිවීමෙන් පසු 2005 දී නැවතත් A9 මාර්ගය වසා දැමුණි.

2009 වසරේදී රජය යුධමය ජයග්‍රහණය ලබාගත් කල සිට සාමාන්‍ය කටයුතු නිසි පරිදි සිදුවීම හේතුවෙන් A9 මාර්ගය හරහා භාණ්ඩ ප්‍රවාහනය අධික ලෙස සිදුවීමට මං විවර කොට ඇත. හමුදාව විසින් සිදුකරන සෝදිසි කිරීම්වලට යටත්ව ආරක්ෂාව යටතේ ට්‍රක්රථ පෙළ වලට යාපන අර්ධද්වීපයෙහි සිට සහ ඒ වෙත භාණ්ඩ ගෙන යාමට සහ ගෙන ඒමට වර්තමානයේදී ඉඩකඩ ලැබී ඇත. මෙමඟින් ඇතිවූ ප්‍රතිඵලය කුමක්ද? 2007 අගභාගයේදී ගැටුම් උච්චස්ථානයකට පත්ව තිබූ අවස්ථාවේදී යාපනයේ සිමෙන්ති කොට්ටයක මිල දිවයිනෙහි අනෙක් ප්‍රදේශ වල මිල මෙන් 4 ගුණයක් වැඩි විය.

නමුත් වර්තමානයේදී යාපනය සහ දිවයිනෙහි අනෙක් ප්‍රදේශ අතර වේගවත් මිල ගණන් ඒකරාශී වීමක් දක්නට ලැබේ. සංවර්ධනය පිළිබඳ පොයින්ට් පෙඩ්රෝ ආයතනය විසින් මාසිකව සිදු කරගෙන යනු ලබන මිල අධීක්ෂකය අනුව 2008 මැයි - ජූලි අතර මාස 3ක කාලයකදී කොළඹට සාපේක්ෂව යාපනයේ තෝරාගත් අයිතම දහය ක දළ මිළ පාරිතෝෂිකය වූයේ 48% කි[4]. එම අයිතම දහය සඳහා 2009 මැයි - ජූලි අතර කාලය තුළ දළ මිල පාරිතෝෂිකය සියයට 24 දක්වා පහළ බැස ඇත. (4 වන රූප සටහන)

පොදු ව්‍යවහාරයන් විසින් රට එකට එක් කිරීම හේතුවෙන් මධ්‍ය කාලීනව ශ්‍රම සහ නිෂ්පාදන සංචලතාවයෙහි ඉහළ යාමක් ඇති වනු ඇත. නමුත් කෙටි කාලීනව, ගැටුම් වලින් පසු ගොඩනැඟෙන ප්‍රදේශයන්හී ආර්ථික තත්වයන් වර්ධනය කිරීම සඳහා මෙම ක්‍රියාදාමයන් ක්‍රමෝපායික මැදිහත්වීම් මඟින් පෝෂණය කිරීම අවශ්‍ය කෙරේ. කෙසේ වෙතත්, දැනට පවතින වෙළඳ ව්‍යාපාර සංවර්ධනය අතින් දියුණු ප්‍රදේශ වලින් ප්‍රතිස්ථානගත කිරීමට වඩා ස්ථාන හරහා නොව භාවිතය සහ භාවිතා කරන්නන් හරහා භූමිය වඩා සංචල කිරීමෙන් ව්‍යුහමය පරිවර්තනය ඉහළ නැංවීමට දායක වන බව පෙනේ. විශේෂයෙන් වැදගත් වනුයේ කෘෂිකාර්මික භූමි වෙළඳ පොළ වල ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කළ හැකි ප්‍රතිසංස්කරණයන්ය. භූමි භාවිතය සහ පැවරීම පිළිබඳ නීති අඩංගු භූමි සංවර්ධන අණපනත් මඟින් විශාල ජනසංඛ්‍යාවක් කෘෂිකර්මය මත යැපෙන තත්වයෙහි තබයි. ජනතාව තම ශ්‍රමයට සරිලන ප්‍රමාණයට වඩා අඩුවෙන් ආදායම් උපයන බැවින් එම නීති මගින් ඔවුන්ව තව තවත් දුගී භාවයෙහිම රඳවා තබයි. මෙම අණපනත් හි නීතිමය තත්වයන් ලිහිල් කිරීම, කෘෂිකාර්මික ආදායම් ඉහළ දැමීමට. දුගී බව අවම කිරීමේ වේගය ඉහළ දැමීමට සහ දිගු කාලීන පරිවර්තනයන් සිදුවීමට හේතුවන බවක් පෙනෙන්නට තිබේ.

භූමි වෙළඳපොළ තරලතාව වැඩි දියුණු කිරීමේ ආයතනික ප්‍රතිසංස්කරණ මඟින් ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා ඉලක්ක ගත දිරි දීමනා ඉදිරියට ගෙන යනු ලබන විටදී ඒවායෙහි ක්‍රියාකාරීත්වය උපරිම වේ. රසායනික කර්මාන්ත ශාලාව කොළඹ (සී.අයි.සී) (Chemicel Industries Colombo) සහ හේලීස් වැනි ස්වාභාවික උපපාදනයන් සහ පෞද්ගලික ආයෝජකයන් මඟින් බොහෝමයක් සංවර්ධනය පසුගාමී ප්‍රදේශ පොහොසත් වන අතර ඒවා නැගෙනහිර පළාත තුළ වන කෘෂි ආර්ථික හැකියාවෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා තම ක්‍රියාකාරීත්වය පුළුල් කරමින් සිටී. ගොවිපළ නිපැයුම් සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම සහ කුසලතා පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා ගොවීන්ට උපකාර කිරීමට දැනට පවතින ප්‍රයත්න, වෙළඳපොළ සම්බන්ධතා මෙන්ම වැඩි ඵලදාවක් ඇති සහල් ප්‍රභේද, විකල්ප වගාවන්, වඩා හොඳ වාරිමාර්ග ක්‍රම සහ කාබනික පොහොර භාවිතයද වැඩි දියුණු කරනු ඇත.

## එක් එක් ප්‍රදේශයට විශේෂිත අභියෝගයන් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

සමෘද්ධි කරා ජනතාව සම්බන්ධ කරවීමේදී වඩාත් ඵලදායී වීම සඳහා විවිධ ප්‍රදේශ මුහුණ දෙන විශේෂිත වූ අභියෝගයන් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය අවශ්‍ය කෙරේ. මෙම වාර්තාවෙහි දැක්වෙන විශ්ලේෂණය

**5 රූප සටහන: සමෘද්ධිය කරා ජනතාව සම්බන්ධ කරවීම ප්‍රදේශ වලට විශේෂිත අභියෝග හඳුනා ගැනීම**




මූලාශ්‍රය: CPP කණ්ඩායම

පෙන්වා දෙන පරිදි සාර්ථක ප්‍රතිපත්තිමය ප්‍රාරම්භකයන් සඳහා මූලික පදනම සෑම ප්‍රදේශයකටම මූලික සේවා සැපයුම වැඩි දියුණු කිරීමයි. ඊට අමතරව, දුගී ජනතාව ඉතා විශාල සංඛ්‍යාවක් ජීවත් වන සංවර්ධනය පසුගාමී ප්‍රදේශ සමෘද්ධිමත් ප්‍රදේශ සමඟ භෞතිකව සම්බන්ධ කරන යටිතල පහසුකම් වලට වෙළඳ හා වාණිජ කටයුතු සඳහා දිරිමත් කළ හැක. තවද ස්ථාන කිහිපයක, වෙළඳපොළ බලවේග විසින් අතහැර දමා තිබෙන ප්‍රදේශයන් හී ආර්ථික නිෂ්පාදනය උත්තේජනය කිරීම සඳහා ඉලක්කගත මැදිහත් වීම් අවශ්‍ය කෙරේ. ප්‍රමුඛතා පෙළගැස්වීමේදී ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්ති කවරේද?

කවර ප්‍රදේශ දරිද්‍රතාවයෙන් යුතුද යන්න සහ වැඩිම දුගී ජනතාවක් ජීවත්වන ප්‍රදේශ දක්වා ඇති දරිද්‍රතා සිතියම් මඟින් වඩාත්ම හොඳින් සාරාංශ ගත කොට ඇති ප්‍රදේශ අනුව විශේෂිත අභියෝග යන්ගේ බරපතල භාවය අනුව ප්‍රතිපත්ති ක්‍රමාංකනය කිරීම සඳහා උපකාර වන රාමුවක් 2009 ලෝක සංවර්ධන වාර්තාව ගොඩනඟයි. බොහෝවිට ඉහතින් දැක්වූ කරුණු දෙක එකිනෙකට සමාන නොවේ, මන්ද දරිද්‍රතාවය ඇති ප්‍රදේශවලින් ඉවත් වීමට වැඩි වශයෙන්ම හේතු ඇත්තේ දුගී ජනයාටය. 3 වන රූප සටහනෙහි '' දරිද්‍රතා කඳු'' මඟින් බස්නාහිර පළාතෙහි සමෘද්ධිමත් ප්‍රදේශ වලට ආසන්නයේ බොහෝ දුගී ජනතාව වාසය කරන බව පෙන්වා දී තිබූ අයුරු සිහියට නඟා ගන්න. රු. 6935ක් වූ ඒක පුද්ගල වියදමක් සහ සියයට 8.2ක දරිද්‍රතා ආපාතයක් ද සහිත බස්නාහිර පළාත රටෙහි සමෘද්ධිමත්ම ප්‍රදේශය වන නමුත් එය ශ්‍රී ලංකාවෙහි දුගී ජනතාවගේ සියයට 16.8 කට සෙවණ සලසයි. මීට ප්‍රතිවිරුද්ධව, රු. 3879 ක ඒක පුද්ගල වියදමක් සහ සියයට 27ක දරිද්‍රතා ආපාතයක් සහිත ඌව පළාත දිවයිනෙහි දුගීම පළාත වන නමුත් එහි ජීවත් වනුයේ ශ්‍රී ලංකාවේ දුගී ජනතාවගේ සියයට 12.3ක් පමණි.

5වන රූප සටහන දුගී ජනතාව ජීවත්වන ප්‍රදේශ පෙන්නුම් කරන අතර සමෘද්ධිය කරා ළඟාවෙමින් තිබෙන ප්‍රදේශ කරා දුගී ජනතාව කෙසේ සම්බන්ධ කරන්නේද යන්න ප්‍රමුඛතාගතකරණය කරයි. ඇත්ත වශයෙන්ම, දුගී ජන ඝනත්වය අතින් සංවර්ධනය පසුගාමී ප්‍රදේශ නොව බස්නාහිර පළාත ඉදිරියෙන්ම සිටී. මෙම වාර්තාව සඳහා වන විශ්ලේෂණය සහ 2009 ලෝක සංවර්ධන වාර්තාවෙහි ප්‍රතිපත්තිමය රාමුව සමෘද්ධිය සඳහා ජනතාව සම්බන්ධ කිරීම සඳහා පහත දැක්වෙන ප්‍රමුඛතා ගෙනහැර දක්වයි.

- ඌව උතුරු මැද සහ වයඹ යන පළාත් හී (සාපේක්ෂ වශයෙන්) විසිරුණු රටෙහි දුගී ජනතාවගේ සුළු කොටසක් සිටී. ශ්‍රම සංචලතාව වැඩි දියුණු කිරීමේ පියවර, සම්බන්ධක ප්‍රතිපත්තීන් හී ප්‍රධාන සාධක විය යුතුවේ. ආයෝජන, අඩු ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට ඉඩ ඇති බැවින් මෙම ප්‍රදේශයන්හී දිගු කලක් පවතින මහා පරිමාණ යටිතල පහසුකම් ඇති කිරීමෙන් පලක් නොවේ. නමුත්, සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැනි මූලික සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම මඟින් සංක්‍රමණයට පහසුකම සැලසීමට සහ ජනතාව සමෘද්ධිමත් ප්‍රදේශ ආසන්නයට ගෙන ඒමට ප්‍රතිපත්ති වලට හැකිවේ.

- මධ්‍යම සබරගමුව සහ දකුණු පළාත්හී ශ්‍රී ලංකාවෙහි දුගී ජනතාවගෙන් සියයට 50ක් පමණ ජීවත් වන නමුත් ඔවුන්ගේ සංචලතාවයට යට බාධා කිහිපයක් ඇත. ශ්‍රම සංචලතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා සේවා වන්හී ගුණාත්මක භාවය ඉහළ නැංවීම වැදගත් වන නමුත් එය පමණක් ප්‍රමාණවත් නොවනු ඇත. මෙම ප්‍රදේශ බස්නාහිර පළාතෙහි වෙළඳපොළවල් සමඟ භෞතිකව සම්බන්ධ කිරීම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් අවශ්‍ය කෙරෙනු ඇත. කොළඹ - නුවර අධිවේගී මාර්ගය සහ දක්ෂිණ මාතර මහා මාර්ගය වැනි අයෝජන. ප්‍රවාහන පිරිවැය පහත හෙළීම මඟින් ඉහළ ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන බවක් පෙනෙන්නට ඇති අතර, ඒවා වේගවත් ආර්ථික වර්ධනයට සහ අන්තර්ගත සංවර්ධනය සඳහා හේතු පාදක වේ.

| 1 වගුව: | එක් මානයක් සඳහා වන ක්‍රමෝපාය - ජනතාව සමෘද්ධිය සමඟ සම්බන්ධ කරවීම සඳහා ප්‍රමුඛතා | | |
|---|---|---|---|
| **පළාත්** | උතුරු, මැද, වයඹ, ඌව | මධ්‍යම, සබරගමුව, දකුණ | නැගෙනහිර, උතුර |
| **අභියෝග** | ඉතා අඩු ජනගහනයක් සහිත සංවර්ධනය පසුගාමී ප්‍රදේශ (ආර්ථික දුරස්ථතාව) | දැඩි ජනගහනයක් ඇති සංවර්ධනය පසුගාමී ප්‍රදේශ (ආර්ථික දුරස්ථතාව සහ නියමාකාරයෙන් ස්ථානගත නොවූ ජන ඝනත්වයන්) | ප්‍රාදේශීය බෙදීම් සහිත, ඉතා අඩු ජනගහනයක් ඇති සංවර්ධනය පසුගාමී ප්‍රදේශ (ආර්ථික දුරස්ථතාව සහ අභ්‍යන්තර බෙදීම්) |
| **ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා** | | | |
| **අවකාශීය වශයෙන් අඳ ව්‍යවහාර** | සෞඛ්‍යය සහ අධ්‍යාපන සේවා සෞඛ්‍යාරක්ෂිත ජල සැපයුම සහ සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම | සෞඛ්‍යය සහ අධ්‍යාපන සේවා සෞඛ්‍යාරක්ෂිත ජල සැපයුම සහ සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම | සෞඛ්‍යය සහ අධ්‍යාපන සේවා සෞඛ්‍යාරක්ෂිත භූමි භාවිතය සහ සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීම |
| **අවකාශීය වශයෙන් සම්බන්ධක යටිතල පහසුකම්** | | අන්තර් කලාපීය ප්‍රවාහන යටිතල පහසුකම් - කොළඹ නගරය සමඟ සම්බන්ධතාව වැඩි දියුණු කිරීම | |
| **අවකාශීය වශයෙන් ඉලක්කගත මැදිහත්වීම්** | | | කෘෂිකර්මාන්ත සඳහා දිරිදීමනා සහ කෘෂිකර්මය පදනම් වූ කර්මාන්ත<br><br>වෙළඳපොළ සම්බන්ධතා විස්තාරණය කිරීම<br><br>කොළඹ අගනගරයෙන් පිටට ආර්ථික කටයුතු තල්ලු නොකිරීම |

- උතුරු සහ නැගෙනහිර පළාත්හී රටෙහි දුගී ජනයාගේ විශාල කොටසක් ජීවත් නොවන නමුත්, ප්‍රාදේශීය වශයෙන් ඇති බෙදීම් ශ්‍රමය සංචලනය සහ නිෂ්පාදන භුවමාරුව සීමා කොට ඇත. පොදු ව්‍යවහාරයන් ඒකාබද්ධතාවයට උපකාර විය හැකි බව පෙන්වා දෙමින් ආහාර නිෂ්පාදන සඳහා මිල ගණන් ඒකරාශී කරමින් තිබිණි. කෙසේ වෙතත් කෙටිකාලීනව, මෙම ප්‍රදේශ වෙත සමෘද්ධිය ලඟා කරවීම සාමයෙහි ප්‍රතිලාභ බලාත්මක කිරීම සඳහා වැදගත් වනු ඇත. නමුත් ප්‍රදේශයෙහි ආර්ථික වශයෙන් ඇති හැකියාව ප්‍රයෝජනයට ගැනීම බස්නාහිර පළාතෙන් පිටතට ආර්ථික කටයුතු රැගෙන යන ප්‍රතිපත්ති මත පදනම් නොවිය යුතුවේ. ඒ වෙනුවට, එය ගොවීන් හට තම වෙළඳපොළ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට උපකාර වන්නාවූ ප්‍රශංසාත්මක ඉලක්කගත ප්‍රයත්න සහිතව, කෘෂිකාර්මික භූමි භාවිතය සහ පැවරීම වැඩි දියුණු කිරීම මත පදනම් විය යුතු වේ. තවද මෙම ප්‍රයත්නයන්, මූලික පොදු සේවා සැපයීමට සහ ඒවායෙහි ගුණාත්මක බවෙහි වර්ධනයන් මඟින් ඉදිරියට ගෙන යා යුතුවේ.

පොදු ව්‍යවහාරයන් සහ සේවා බෙදා හැරීම් තත්‍වයන්, සම්බන්ධක යටිතල පහසුකම් සහ ඉලක්ක ගත මැදිහත් වීම් හි ක්‍රමාංකිත සංයොජනයක් භාවිතා කරමින් ජනතාව සමෘද්ධිය කරා සම්බන්ධ කරවීමේ ප්‍රත්පත්තිමය විකල්පයන් 1වන වගුව සාරාංශගත කරයි. පළාත් හරහා ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ බෙදා

හදා ගන්නා අතරතුර ශ්‍රී ලංකාවට සමෘද්ධි කරා පිය නඟන ගමන මධ්‍ය ආදායම් හරහා වේගවත් කර ගැනීමට මෙම ප්‍රතිපත්ති උදවු වේ. ප්‍රතිපත්ති සම්පාදකයන් අවබෝධ කරගන්නා කරුණ නම් ස්ථාන කිහිපයකට තවදුරටත් ආර්ථික සමෘද්ධිය සංකේන්ද්‍රණය වනු ඇති නමුත් සමෘද්ධිය සමඟ වැඩි පිරිසක් සම්බන්ධ වනු ඇත.

**පසුසටහන්:**

1 බහාලුම් ඇසුරුම්ගත කිරීම පිළිබඳ අන්තර් ජාතික සඟරාවට අනුව, ලෝකයෙහි වරාය ශ්‍රේණිගත කිරීම් අනුව, සැලකිය යුතු ප්‍රමාණයක නැවකින් තවත් නැවකට භාණ්ඩ මාරු කිරීම ඇතුළුව කොළඹ වරාය 2006 දී 34 වන ස්ථානයේ සිට 2008 දී 27 වන ස්ථානය දක්වා ඉහළට ගොස් තිබුණ. ලෝක ආර්ථික අර්බුදය හේතුවෙන් නැව් බඩු ප්‍රමාණයන් ඉතා තියුණු අන්දමින් සංකෝචනය වී ඇත. නමුත් දැන් එම තත්වයෙන් සෙමින් යථා තත්වයට පත්වෙමින් තිබේ.

2 වාර්ෂික කර්මාන්ත සංගණනය, 2003:2007 මිල ගණන්: සියයට 80ක කර්මාන්ත අංශයේ ආකලිත වටිනාකම්

3 ශ්‍රී ලංකා ඇස්තමේන්තු 2009 අප්‍රේල් මාසයේදී ලෝක බැංකුව මඟින් සිදුකරන ලද නැව් මඟින් ප්‍රවාහනය සඳහා මිල ගණන් සමීක්ෂණය මත පදනම් විය. එක්සත් ජනපද ඇස්තමේන්තු, කිලෝමීටරයකට ඩොලර් 1.25ක් පමණ හෝ සැතපුමකට ඩොලර් 2.00 ලෙස පොදු ව්‍යවහාරික නීතියෙහි සඳහන් වන එක්සත් ජනපදය පොදුවේ ප්‍රකාශිත බහාලුම් නැව්ගත කිරීමේ මිලගණන් මත පදනම් විය.

4 යාපනයේ දිස්ත්‍රික්කයෙහි තිරුනෙල්වේලි වෙළඳපොළ කල්මුණේ (අම්පාර දිස්ත්‍රික්කය), මඩකලපුව නගරය (මඩකලපු දිස්ත්‍රික්කය), සහ වවුනියා නගරය යන ප්‍රදේශ වල සතියකට දෙවතාවක් මිල අධීක්ෂකය මිල ගණන් එක් රැස් කරයි. මාසික දත්ත මෙම සතියක දෙවතාවක් සිදු කරන්නාවූ නිරීක්ෂණයන්ගේ සරල සාමාන්‍ය අගයයි. මෙහි දක්වා ඇති වෙළඳ ද්‍රව්‍ය දහය, යාපනය මිලඟ ''ආනයනකරුවෙකු'' කරන වෙළඳ ද්‍රව්‍ය බොහොමයක් ඇතුළත් වන්නකි. එබැවින් ඒකාබද්ධතාවය අපේක්ෂා කළ හැකි තත්වයකදී මෙම වෙළඳ ද්‍රව්‍ය වන සාපේක්ෂ වශයෙන් විශාල ලෙස මිල පහළ යාම අපේක්ෂා කළ හැකි විය. ඇත්ත වශයෙන්ම, දේශීය වෙළඳපෙළෙහි ''අධික සැපයුම'' හේතුවෙන් හුදකලා බවින් යුතු වූ කාල පරිච්ඡේදයන් හිදී රටෙහි අනෙකුත් ප්‍රදේශ වලට වඩා යාපනය ප්‍රදේශයේ සමහරක් නිෂ්පාදන මිලෙන් අඩුවිය. එවැනි නිෂ්පාදනයන්ට උදාහරණ නම් රතු ළූණු, ගෝවා සහ කැරට්ටිය.